කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **17** WW/O/22/12/10/01
වර්ණය : ඇම්බර්

# “මැන්ඩවුස්” සුළි කුණාටුව පිලිබඳ අවවාදාත්මක නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2022 දෙසැම්බර් මස 10 දින පෙ.ව. 04.00 තෙක් වලංගු වන පරිදි
2022 දෙසැම්බර් මස 10 දින පෙ.ව. 01.00 ට නිකුත් කරන ලදී.


**මන්නාරම සිට කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකළපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ සහ නිරිතදිග බෙංගාල බොක්ක සඳහා**

**සැලකිලිමත් වන්න!**

**නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ “මැන්ඩවුස්” සුළි කුණාටුව ඊයේ දින (09) රාත්‍රී 08.30 වන විට යාපනය සිට කි.මී. 300ක් පමණ උතුරට බරව ඊසාන දෙසින් අක්ෂාංශ 12.2N සහ දේශාංශ 80.6E ස්ථානගතව පැවතුනි. එම පද්ධතිය වයඹ දෙසට ගමන් කර දෙසැම්බර් 10 අළුයම් කාලය වන විට නිරිත දිග බෙංගාල බොක්ක හරහා උතුරු තමිල්නාඩු, පුදුචෙරි සහ දකුණු ආන්ද්‍ර ප්‍රදේශ වෙරළ තීරය හරහා ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.**

එම පද්ධතියේ බලපෑමෙන් දිවයිනට උතුරු සහ නැගෙනහිර දෙසින් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ වල විටින් විට ඉතා තද සුළං සමග තද වැසි ඇති විය හැකි අතර එම මුහුදු ප්‍රදේශ ඉතා රළු සහ විටින් විට දළ රළු විය හැක.

කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය හරහා මඩකළපුව දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල මුහුදු රළ උස (මීටර්. 2.5 – 3.5 ක් පමණ) ඉහළ යාමේ හැකියාවක් පවතින අතර ගාල්ල සිට හම්බන්තොට සහ පොතුවිල් හරහා මඩකලපුව දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල මුහුදු රළ උස (මීටර්. 2.0 – 2.5 ක් පමණ) ඉහළ යාමේ හැකියාවක් ද පවතී.




සුළි කුණාටුවේ අපේක්ෂිත ගමන් මාර්ගය **(Source: RSMC India)**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

පද්ධතියේ ගමන් මාර්ගය පිළිබඳ අනාවැකිය

| දිනය/ වේලාව (පැය) | පිහිටීම ( අක්ෂාංශ/ දේශාංශ) | උපරිම සුළං වේගය ( පැ.කි.මී) | වර්ගය |
|---|---|---|---|
| 10.12.22/05.30 | 12.7/80.0 | 55-65, 75 දක්වා වැඩි විය හැක | ගැඹුරු පීඩන අවපාතය |
| 10.12.22/11.30 | 12.9/79.6 | 40-50, 60 දක්වා වැඩි විය හැක | පීඩන අවපාතය |
| 10.12.22/17.30 | 13.1/79.0 | 25-35, 45 දක්වා වැඩි විය හැක | අඩු පීඩන කලාපය |

**අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:**

- **මන්නාරම සිට කන්කසන්තුරය සහ ත්‍රිකුණාමලය හරහා මඩකළපුව දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ, නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශ (07N - 17N, 80E – 87E) සහ දකුණු මුහුදු ප්‍රදේශවලට (02N - 06N, 78E – 86E) නැවත දැනුම්දෙන තෙක් යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**

- **දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩ බිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.**

- **කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

***පද්ධතිය අඛණ්ඩ නිරීක්ෂණ යටතේ පවතින අතර මීළඟ පණිවිඩය, 2022 දෙසැම්බර් 10 පෙ.ව.04.00 ට නිකුත් කෙරේ.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

Bulletin No: **17** WW/O/22/12/10/01
COLOR: **Amber**

# Advisory for Cyclonic storm “Mandous”.

Issued by the Natural Hazards Early Warning Centre
Issued at 01.00 a.m. 10 December 2022, valid until 04.00 a.m. 10 December 2022


## For deep and shallow sea areas from Mannar to Pottuvil via Kankasanturai, Trincomalee & Batticaloa and Southwest Bay of Bengal.

**PLEASE BE AWARE!**

**The Cyclonic Storm “Mandous” over Southwest Bay of Bengal was located 280km north-northeast of Jaffna near latitude 12.2N and longitude 80.6E at 08.30pm yesterday (09). This system is very likely to move northwestwards and cross North Tamil-Nadu, Puducherry and South Andhra Pradesh coast over Southwest Bay of Bengal around early hours of 10th December.**

Under the influence of this system, the deep and shallow sea areas of northern and eastern coast will be very rough to high with very strong gusty winds and heavy rain.

There is a possibility of swell waves increasing up to (2.5 – 3.5) m in the sea areas off the coast extending from Kankasanturai to Batticaloa via Trincomalee and swell waves can increase up to (2.0 – 2.5) m in the sea areas off the coast extending from Galle to Batticaloa via Hambanthota and Pottuvil.




**Expected path of the cyclone (Source: RSMC-India)**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**The forecast track and intensity of the system are given in the following table**

| Date/Time (SLST) (Hrs) | Position (Lat. °N/ Long. °E) | Maximum wind speed (Kmph) | Category of cyclonic disturbance |
|---|---|---|---|
| 10.12.22/05.30 | 12.7/80.0 | 55-65 gusting to 75 | Deep Depression |
| 10.12.22/11.30 | 12.9/79.6 | 40-50 gusting to 60 | Depression |
| 10.12.22/17.30 | 13.1/79.0 | 25-35 gusting to 45 | Low pressure area |

**Actions Required:**

- **Naval and fishing communities are advised not to venture into the deep and shallow sea areas off the coast extending from Mannar to Pottuvil via Kankasanturai, Trincomalee & Batticaloa, Southwest Bay of Bengal (07N - 17N, 80E – 87E) and Southern Sea areas (02N - 06N, 78E – 86E), until further notice.**

- **Those who are out at aforementioned sea regions are advised to return to coasts or moved safer areas immediately.**

- **Fishing and naval community are requested to be attentive to future forecasts issued by the Department of Meteorology in this regard.**

***The system is under continuous surveillance and the next message will be issued at 04.00 a.m., 10th Dec, 2022.